සියලුම හිමිකම් ඇවිරිණි.

# සමාජ විද්‍යා කලාප/ කොට්ඨාස තරඟාවලිය
# 2023

| | |
|---|---|
| 9 ශ්‍රේණිය<br>Grade 9 | පැය 1 යි මිනිත්තු 30<br>One hour 30 Minutus |

ශිෂ්‍යාගේ නම/ ශිෂ්‍යාවගේ නම :- ..............................

ඉගෙනුම ලබන පාසල :- ..............................

පාසල අයත්වන කාණ්ඩය යටින් ඉරක් අඳින්න.

200 දක්වා/ 201- 500/ 501 - 1000 / 1000 ට වැඩි

- 1 සිට 5 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පෘතුගීසීන් පෙරදිගට පැමිණි නැව් මාර්ගය කාලයක් ගත වනතුරු අන්අයට දැනගැනීමට ඉඩ නොදුන්නේ,
    1. එම මාර්ගයේ පවතින දුෂ්කර බව නිසාය.
    2. අන් ජාතීන්ට පෘතුගීසීන් සතු දැනුම නොමැති නිසාය.
    3. නැව් මාර්ගය දැනගැනීම ඔවුන්ට අවාසිදායක වන නිසාය.
    4. එම මාර්ගයේ යාත්‍රා කිරීමට අන්අයට සුදුසු යාත්‍රාවන් නොමැති නිසාය.

02. VOC සමාගමේ මූලස්ථානය පිහිට වූයේ,
    1. දකුණු ආසියාතික දූපත් වලය
    2. අග්නිදිග ආසියාතික දූපත් වලය
    3. නැගෙනහිර ආසියාතික දූපත් වලය
    4. ඉන්දීය උපමහද්වීපය තුළය

03. ලන්දේසීන් ආසියාවට පැමිණි සමයේ උඩරට රජු වූයේ,
    1. පළමුවන විමලධර්මසූරිය රජතුමාය
    2. දෙවන රාජසිංහ රජතුමාය
    3. දෙවන විමලධර්මසූරිය රජතුමාය
    4. සෙනරත් රජතුමාය

04. ''සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම'' දැක්ම කරගත් නීතිය බලාත්මක කිරීම සඳහා පවතින රාජ්‍ය ආයතනය කුමක් ද?
    1. පොලිස් දෙපාර්තමේන්තුව
    2. නීතිපති දෙපාර්තමේන්තුව
    3. රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
    4. බන්ධනාගාර දෙපාර්තමේන්තුව

05. රටක හෝ ප්‍රදේශයක නිරපේක්ෂ පිහිටීම යනු,
    1. අවට රටවල් සමඟ පිහිටීමයි.
    2. දේශීය බණ්ඩාංක ගතව පිහිටීමයි.
    3. භූගෝලීය බණ්ඩාංක ගතව පිහිටීමයි.
    4. අන් රටවල් අතර ඉදිරියෙන් පිහිටීමයි.

- **6 - 10 තෙක් ප්‍රශ්නවල වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා එහි යටින් ඉරක් අඳින්න.**

06. පෘතුගීසින් පලවා හැරීම සඳහා ලන්දේසීන්ගේ සහාය ලබාගැනීමට අපේ රජවරුන් ක්‍රියා කිරීමට ප්‍රධාන හේතුව වූයේ,
    1. පෘතුගීසින් අප රටේ ආර්ථිකයට තදබල හානියක් කළ නිසාය.
    2. පෘතුගීසින් සතු යුධ ශක්තිය අපේ රජවරුන්ට නොමැති නිසාය.
    3. පෘතුගීසින්ගේ සමස්ත ක්‍රියාකාරකම් කෙරෙහි ඇතිවූ අප්‍රසාදය නිසාය.
    4. ඔවුන් අවස්ථා කිහිපයකදීම උඩරට රාජ්‍යයට පහර දීමට පැමිණි නිසාය.'

07. නව මුහුදු මාර්ගයක් සොයා යාමට යුරෝපා ජාතීන් පෙළඹවීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ,
    1. මුස්ලිම්වරු සතුව පැවති පෙරදිග වෙළඳ ආධිපත්‍ය යුරෝපා ජාතීන් සතු කර ගැනීමේ අපේක්ෂාව නිසා.
    2. ලෝකය පිළිබඳව පැවති කුතුහලය හා ත්‍රාසජනක අත්දැකීම් ලබාගැනීමට ඇති ආශාව නිසා.
    3. කොන්ස්තන්තිනෝපලය අහිමි වීමත් සමඟ යුරෝපයට භාණ්ඩ සැපයුම සීමා වීම නිසා.
    4. මාලිමාව, උතුරුතරු මාපකය වැනි විද්‍යාත්මක උපකරණ සොයාගත් නිසා.

08. අප ජීවත්වන පෘථිවි ග්‍රහලෝකය සමස්ත ජීව පරපුරේ වාස භූමියයි. ජීවී ප්‍රජාව නිර්මාණය වී ඇත්තේ ගහනයන් රාශියක එකතුවෙනි. ඉහත ප්‍රකාශයට වඩාත්ම ගැළපෙන පිළිතුර වන්නේ,
    1. පෘථිවිය ජීවය ඇතිවීමට යෝග්‍ය ලෙස ස්ථාන ගතවී ඇති බවය.
    2. ජීවී අජීවී පරිසර අතර නිරන්තර අන්තර් ක්‍රියාකාරීත්වයක් පවතින බවය.
    3. ජෛව විවිධත්වයක් පෘථිවිය සතුව ඇති බවය.
    4. ජීවීන්ට හිතකර දේශගුණයක් පෘථිවිය සතුව ඇති බවය.

09. විද්‍යාවේ දියුණුවක් සමඟ වේගවත් වූ නව සොයා ගැනීම් තාක්ෂණික දියුණුව මත වර්ධනය විය. එහි ප්‍රතිඵලය හැමවිටම යහපත් නොවේ. තාක්ෂණික වෙනස්වීම මත සිදුවූ අහිතකර බලපෑම් අතර වඩාත් ප්‍රබලතම බලපෑම වන්නේ,
    1. පරිසර දූෂණය වේගවත් වීමයි.
    2. මිනිසුන් යාන්ත්‍රීකරණය වීමයි.
    3. සමාජය සංකීර්ණ වීමයි.
    4. අනවශ්‍ය පරිභෝජන රටාවකට යොමුවීමයි.

10. තිරසාර සංවර්ධන සංකල්පය වඩාත් හොඳින් පැහැදිලි කෙරෙන ප්‍රකාශය තෝරන්න.
    1. රටක ආර්ථික සමාජීය අංශවල ඇතිවන දියුණුවයි.
    2. සම්පත් හැකිතාක් භාවිත කර සිදුකරන සංවර්ධනයයි.
    3. රටක සමාජීය සංස්කෘතික සදාචාරාත්මක දියුණුවයි.
    4. අනාගත අවශ්‍යතාවලට සම්පත් ඉතිරිකර වර්තමානයේ සම්පත් යොදාගෙන කරන පරිසර හිතකාමී සංවර්ධනයයි.

- **11 සිට 15 තෙක් ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

11. ජනතාව අතර ඇතිවන සුළු ආරවුල් සාම්ප්‍රදායික අධිකරණ පද්ධතියෙන් පරිබාහිරව නිරාකරණය කිරීම සඳහා ................................................................ අප රටේ පිහිටුවා ඇති විකල්ප ආයතනයකි.

12. සූර්ය ශක්තිය ආධාරයෙන් ජලය එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට චක්‍රීයව සංසරණය වීම ................................................................ ලෙස හඳුන්වයි.

13. පෘතුගීසින් සකස් කළ ලන්දේසීන් විධිමත් කරන ලද ............................................................ නම් ලේඛන මගින්, ඉඩම්වල අයිතිය බදු අයකිරීම පිළිබඳ විස්තර දැක්වේ.

14. පෙරදිග ලන්දේසි සතු ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් වෙත පවරා දෙන ලෙස ඕලන්ද පාලක ................................ ............................... රජතුමා විසින් කිව් ලිපිය මගින් දැනුවත් කර ඇත.

15. එක් ජීවී විශේෂයක DNA අණු තවත් ජීවී විශේෂයක DNA අණු සමග මුසුකර බිහිකරන නව ජීවී ප්‍රභේද කරන ක්‍රියාවලිය ............................................................. ලෙස හැඳින්වේ.

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

16. ලොව උසම ස්ථානය එවරස්ට් කඳු මුදුන නම්, මුහුදු මට්ටමේ සිට මීටර් 8399 ක් පහළින් ගොඩබිම පිහිටි ගැඹුරුම ස්ථානය කුමක් ද ?

..............................................................................................................................................

17. උඩරට රාජධානියේ තොරතුරු උපායශීලිව රැස් කරමින් උඩරට ආක්‍රමණය සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කළ ඉංග්‍රීසි සිවිල් නිලධාරියා කවුරුන් ද ?

..............................................................................................................................................

18. ජනප්‍රිය බෞද්ධ ගීත කිහිපයක්ම රචනා කරමින් පන්සලේ පියතුමා ලෙසින් ද හඳුන්වා දුන් ක්‍රිස්තියානි පූජකතුමා කවුරුන් ද ?

..............................................................................................................................................

19. එරල් මුහුද ආසියානු කලාපයට අයත් අභ්‍යයන්තර මුහුදකි. මෙම මුහුදට ගලා බසින ගංගාවක් නම් කරන්න.

..............................................................................................................................................

20. කෝට්ටේ යුගයේ රචනා කරන ලද ලෝවැඩ සඟරාව උපදේශ කාව්‍යවකි. මෙම ග්‍රන්ථය රචනා කළ හිමි නම කවුරුන් ද ?

..............................................................................................................................................

- **21 සිට 25 දක්වා ''අ'' සහ '' ආ'' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධ නාමය අනුව නිවැරදිව ගලපා පිළිතුර යටින් ඉරක් අඳින්න.**

| '' අ'' තීරය | ''ආ'' තීරය |
|---|---|
| 21. i. ලන්දේසි අධිකරණ පද්ධතියේ ඉහළම උසාවිය යි. | A - සිවිල්රාද් |
| ii. විවාහ සම්බන්ධ නඩු විසඳූ ආයතනය යි. | B - පිස්කල් උසාවි |
| iii. දිසාවේ වරයා සභාපති වූ ආයතනය යි. | C - රාද්වෑන් ජස්ටිට් |
| iv. දේශීය නිලධාරීන්ට සුළු බලතල තිබූ උසාවිය යි. | D - ඉඩම් උසාවි |

1. CADB 2. BDAC 3. CABD 4. BCAD

22. ‘‘ අ’’ තීරය ‘‘ආ’’ තීරය

i. රෆායල් සැන්ඩ් — A - තාරක විද්‍යාව
ii. මයිකල් සර්වේක් — B - ගෘහ නිර්මාණ ශිල්පය
iii. නිකලස් කොපර්නිකස් — C - දේශ ගවේෂණය
iv. ක්‍රිටෝෆර් කලම්බස් — D - වෛද්‍ය විද්‍යාව

1. ABDC 2. CBDA 3. DACB 4. BDAC

23. ‘‘ අ’’ තීරය ‘‘ආ’’ තීරය

i. ඕබ්, යෙනිසි — පැසිෆික් සාගරය
ii. අමූර්, හොවැංහෝ — ආක්ටික් සාගරය
iii. ඉන්ද්‍ර, මීකොං — පර්සියන් බොක්ක
iv. යුෆ්‍රටීන්, ටයිග්‍රීස් — ඉන්දියන් සාගරය

1. ABCD 2. BACD 3. BADC 4. CABD

24. ‘‘ අ’’ තීරය ‘‘ආ’’ තීරය

i. පහතරට තෙත් කලාපීය වනාන්තර — A - බුරුත, කළුවර, වීර
ii. පහතරට වියළි - මිශ්‍ර සදාහරිත වනාන්තර — B - හොර, කීන, ගොඩපර
iii. කඳුකර තෙත් කලාපීය වනාන්තර — C - මහරත් මල්, අරළු, බුළු
iv. කඳුකර වියළි කලාපීය වනාන්තර — D - වල්සපු, කීන, මිහිරිය


1. BADC 2. ABDC 3. DCAB 4. DCBA

25. ‘‘ අ’’ තීරය ‘‘ආ’’ තීරය

i. පටු දිගැටි හැඩය ගත් මුදුන් කිහිපයකින් සමන්විත භූ -ලක්ෂණය — A - නිම්නය
ii. තැනිතලා බිමක වෘතාකාරව විහිදුණු එක් මුදුනක් සහිත භූ - ලක්ෂණය — B - කපොල්ල
iii. කඳුවැටියක මුදුන් දෙකක් අතර පිහිටි විවරය — C - කඳුවැටිය
iv. උස්බිම් දෙකක් අතර පිහිටි පහත්බිම — D - කොත්කන්ද

1. DBAC 2. CDBA 3. BCDA 4. CDAB

- **26 සිට 30 දක්වා ඉදිරියෙන් ඇති රූපය සම්බන්ධ කර ගනිමින් පිළිතුරු සපයන්න.**

26. 

i. මෙම රූපය හා සම්බන්ධ යුරෝපා ජාතිය නම් කරන්න.

..............................................................................................

ii. ඔවුන් නිසා ලංකා සමාජයට එක් වූ නව ජන වර්ගය කුමක් ද ?

..............................................................................................

27. 


i. මෙම ඡායා රූපයෙන් දැක්වෙන නායකයා නම් කරන්න.

..............................................................................................

ii. මෙතුමාගෙන් සිදු වූ වැදත්ම සේවාව සඳහන් කරන්න.

..............................................................................................

..............................................................................................

28. 

i. මෙම කලා නිර්මාණය කුමක් ද ?

..........................................................................................

ii. පොළොන්නරු යුගය වන විට මෙම නිර්මාණයේ වූ වෙනස කුමක් ද ?

..........................................................................................

29. 

i. මෙම නිර්මාණය කුමන රටකට අයත් සංකේතයක් ද ?

..........................................................................................

ii. මෙය නිර්මාණය හා සම්බන්ධ රජතුමාගේ රාජ වංශය නම් කරන්න.

..........................................................................................

30. 

i. මෙම ඡායාරූපය හා සම්බන්ධ රූපික ප්‍රකාශනයේ අදහස ලියන්න.

..........................................................................................

ii. පරිසරය සම්බන්ධව මෙම ප්‍රකාශයේ වැදගත්කම පිළිබඳ කෙටි වාක්‍යයක් ලියන්න.

..........................................................................................

- **31 සිට 35 දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුර සපයන්න.**

31. යුරෝපය තුළ දේශ ගවේෂණයට සුදුසු වන සේ ගොඩනැගී තිබූ විද්‍යාත්මක පසුබිමේ ස්වභාවය පිළිබඳ කරුණු 02 ක් ලියන්න.

I. ..........................................................................................

..........................................................................................

..........................................................................................

II. ..........................................................................................

..........................................................................................

..........................................................................................

(ලකුණු 2x2 = 4)

32. i. යෝග්‍ය තාක්ෂණය යනු කුමක්දැයි සරලව හඳුන්වන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

(ලකුණු 2)

ii. අප රටේ කෘෂිකර්මාන්තයට යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමේ වාසියක් සඳහන් කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

(ලකුණු 2)

33. i. ජපානයේ පෙට්‍රෝ රසායන කර්මාන්තයේ ප්‍රධාන නිෂ්පාදන 02 ක් ලියන්න.

1. ................................................................ 2. ................................................................

(ලකුණු 2)

ii. ජපානයේ නිෂ්පාදිත මෝටර් රථ සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීමට හේතු 02 ක් ලියන්න.

I. ....................................................................................................................................................

....................................................................................................................................................

II. ....................................................................................................................................................

....................................................................................................................................................

(ලකුණු 2)

34. i. ශ්‍රී ලංකාවේ ජලවහන පද්ධතියේ දක්නට ලැබෙන ජලවහන රටා 02 ක් ලියන්න.

1. ................................................................ 2. ................................................................

(ලකුණු 2)

ii. ශ්‍රී ලංකාවේ තෙත් කලාපය හරහා ගලා බසිනා ගංගා හා වියළි කලාපය හරහා ගලා යන ගංගා අතර දක්නට ලැබෙන වෙනස්කම් 02 ක් ලියන්න.

I. ....................................................................................................................................................

II. ....................................................................................................................................................

(ලකුණු 2)

35. i. නීතිය බලාත්මක කිරීම සඳහා අප රටේ ක්‍රියාත්මක වන ආයතනයක් වන ශ්‍රී ලංකා පොලීසියේ ආදර්ශ පාඨය ලියන්න.

....................................................................................................................................................

(ලකුණු 2)


ii. නීතිය බලාත්මක කිරීමේ ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන වගකීම සටහන් කරන්න.

....................................................................................................................................................

(ලකුණු 2)

- **36 - 40 දක්වා දී ඇති ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.**

36. මන්නාරම් දූපත
37. මඩකලපුව
38. පේදුරුතුඩුව
39. ත්‍රිකුණාමල වරාය
40. මහනුවර


N

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. Akura Pilot සමනල දැනුම T සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**